ස්වල්පයක් ක්රියා කොට බොහෝමයක් ප්රතිලාභ ලැබීය.

අල් බර්රා -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා වෙත ආයුධයක් සඟවාගෙන මිනිසෙකු පැමිණ “අල්ලාහ්ගේ දූතයාණනි, මම සටන්
කරමි. එසේ නැතිනම් මම දෙවිඳුන්ට යටත් වෙමි යැයි පැවසූහ. එතුමාණෝ: දෙවිඳුන්ට යටත්
වනු පසුව සටන් කරනු යැයි ඔහුට පැවසූහ. පසුව ඔහු දෙවිඳුන්ට යටත් වී පසුව සටන් කොට
ඝාතනය කරනු ලැබීය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්-තුමා “ස්වල්පයක් ක්රියා කොට බොහෝමයක් ප්රතිලාභ ලබා ගත්තේය.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

මිනිසෙකු නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා සමඟ ජිහාද් කිරීමේ අපේක්ෂාවෙන් ආයුධයක් රැගෙන එතුමා වෙත පැමිණයහ. ඔහු එය සඟවාගෙන සිටියේය. එවිට ඔහු ඉස්ලාමය වැළඳ ගෙන සිටියේද නැත. ඔහු: අල්ලාහ්ගේ දූතයාණනි, මම ජිහාද් කොට පසුව ඉස්ලාමය වැළඳ ගන්නද එසේ නැතිනම් ඉස්ලාමය වැළඳ ජිහාද් කරන්න දැයි විමසා සිටියේය. එවිට එතුමා ඔබ ඉස්ලාමය වැළගන්න. පසුව ජිහාද් කරන්නැයි පැවසුහු. පසුව එම පුද්ගලයා ඉස්ලාමය වැළද ජිහාද් කළහ. ඔහු ඝාතනය කරනු ලබන තෙක්ම සටන් කළහ. පසුව අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- “අඩුවෙන් ක්රියා කොට වැඩි ප්රතිලාභයක් ලබා ගත්තේය යැයි පැවසූහ. එනම් එය ඔහුගේ ඉස්ලාමය වැළදගත් කාලය සංසන්දනය කරමිනි. ඔහු ඉස්ලාමය වැළදගත් කාලය හා ඔහු ඝාතනය ලක් වූ කාලය අතර තිබුණේ කුඩා කාලයකි. ඒ සමගම ඔහු මහත් ප්රතිලාභ හිමි කරගත්හ. හේතුව අඅල්ලාහ්ගේ මාර්ගයේ ජිහාද් කරනුයේ ඔහුගේ වදන දන්වා සිටිනු පිණිසය. එය සෙසු ක්රියාවන්ට වඩා උතුම් හා මහත් කුසල් ගෙන දෙන්නකි.

https://sunnah.global/hadeeth/si/show/3570